# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2138/5 – 2019 අගෝස්තු 26 වැනි සඳුදා – 2019.08.26

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: අයිආර්/සීඕඑම්/05/2018/90.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ නියමකර දක්වා ඇති කාරණය පිළිබඳව –

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

සමස්ත ලංකා මෝටර් සේවක සමිතිය, අංක 10/21ඒ, ජයසුන්දර පෙදෙස, ඇල්හේන පාර, මහරගම, (එච්. පී.සුනීතා පද්මසීලි මිය වෙනුවෙන්),

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, අංක 200, කිරුල පාර, කොළඹ 05.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය රවීන්ද්‍ර සමරවීර වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968


1A – G 30826 – 21 (2019/08)



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, රත්මලාන, සිරිමල් උයන, අරලිය මාවත, අංක 03,ආර්. එස්. ආරියප්පෙරුම මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**රවීන්ද්‍ර සමරවීර,**
කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය.

2019 අගෝස්තු මස 13 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: අයිආර්/සීඕඑම්/05/2018/90.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**

**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

සමස්ත ලංකා මෝටර් සේවක සමිතිය, අංක 10/21ඒ, ජයසුන්දර පෙදෙස, ඇල්හේන පාර, මහරගම, (එච්. පී.සුනීතා පද්මසීලි මිය වෙනුවෙන්),

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, අංක 200, කිරුළ පාර, කොළඹ 05.

**ඉහත සඳහන් පාර්ශවයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ,**

''ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ කොළඹ ප්‍රාදේශීය පාලන කාර්යාලයේ යතුරු ලිපිකාරිනියක ලෙස සේවය කරන එච්. පී. සුනීතා පද්මසීලි මහත්මියට විරුද්ධව පැවති විනය පරීක්ෂණයෙන් අනතුරුව පසු වැටුප් රහිතව මාස 03ක් සේවය තහනම් කර ස්ථාන මාරු කිරීම(වෙනත් සේවා ස්ථානයකට අනුයුක්ත කිරීම) මගින් අසාධාරණයක් සිදු වී තිබේද? යන්න හා එසේ අසාධාරණයක් සිදුව තිබේ නම් ඇයට හිමිවිය යුතු සහන කවරේද? යන්න පිළිබඳව වේ.''

**ඒ. විමලවීර,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2019 ජූලි මස 31 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

09 - 290

මගේ අංකය: අයිආර්/සීඕඑම්/02/2018/252.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ නියමකර දක්වා ඇති කාරණය පිළිබඳව –

බී. ඒ. එස්. සී. අබේවර්ධන මයා, බී 05/01/04, හිඹුටු උයන නිවාස ක්‍රමය, මුල්ලේරියාව නව නගරය, මුල්ලේරියාව.

සහ

ජාතික නිවාස සංවර්ධන අධිකාරිය, තැ.පෙ. 1826, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ. ගාඩිනර් මාවත, කොළඹ 02.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය රවීන්ද්‍ර සමරවීර වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් සමතයකට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, රත්මලාන, සිරිමල් උයන, අරලිය මාවත,අංක 03,ආර්. එස්. ආරියප්පෙරුම මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**රවීන්ද්‍ර සමරවීර,**
කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය.

2019 අගෝස්තු මස 20 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: අයිආර්/සීඕඑම්/02/2018/252.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**

**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

බී. ඒ. එස්. සී. අබේවර්ධන මයා, බී 05/01/04, හිඹුටු උයන නිවාස ක්‍රමය, මුල්ලේරියාව නව නගරය, මුල්ලේරියාව.

සහ

ජාතික නිවාස සංවර්ධන අධිකාරිය, තැ.පෙ. 1826, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ. ගාඩිනර් මාවත, කොළඹ 02.

ඉහත සඳහන් පාර්ශවයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ,

''ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ සේවකයකු වන බී. ඒ. එස්. සී. අබේවර්ධන මහතා 2015.09.11 දින සිට වැඩ තහනම් කර පවත්වන ලද විනය පරීක්ෂණයකින් අනතුරුව සියලු චෝදනාවලින් නිදොස් කර පසු වැටුප හා ඔහුට හිමි වරප්‍රසාද සමග නැවත සේවයේ පිහිටුවීමට තීරණය කළ ද, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නැවතත් විනය පරීක්ෂණයක් පැවැත්වීමට කටයුතු කිරීම හේතුවෙන් බී. ඒ. එස්. සී. අබේවර්ධන මහතාට අසාධාරණයක් සිදුව තිබේ ද යන්න හා එසේ සිදුව තිබේ නම් ඔහුට හිමි සහනයන් කවරේද යන්න පිළිබඳව වේ.''

**ඒ. විමලවීර,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2019 අගෝස්තු මස 09 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

09 - 291

මගේ අංකය: අයිආර්/සීඑම්/02/2018/287.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ නියමකර දක්වා ඇති කරුණු පිළිබඳව –

එච්. සී. සමීර මයා, අංක ඒ/4, ජාතික නිවාස, තිඹිරිගස්යාය පාර, කොළඹ 05.

සහ

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය, 1 වන මහල, කම්කරු මහලේකම් කාර්යාලය, කොළඹ 05.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය රවීන්ද්‍ර සමරවීර වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, තලවතුගොඩ, නුගේගොඩ පාරෙන් එහා, එකමුතු මාවත, අංක 570/බී/1, පී. නවරත්න මයා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**රවීන්ද්‍ර සමරවීර,**
කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය.

2019 අගෝස්තු මස 13 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: අයිආර්/සීඑම්/02/2018/77.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**

**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

එච්. සී. සමීර මයා, අංක ඒ/4, ජාතික නිවාස, තිඹිරිගස්යාය පාර, කොළඹ 05.

සහ

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය, 1 වන මහල, කම්කරු මහලේකම් කාර්යාලය, කොළඹ 05.

ඉහත සඳහන් පාර්ශවයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ,**

''2016.10.02 දින අනියම් සේවකයකු ලෙස ද, 2017.01.01 දින සිට ස්ථිර සේවකයකු ලෙස ද, සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ සේවයේ නියුතු එච්. සී. සමීර මයාට කළමණාකරන සේවා 30/2006 චක්‍රලේඛයේ ප්‍රතිපාදන අනුව 2012.09.01 ලබාදුන් වැටුප් වර්ධක 09 නොසලකා හැර 2013 වර්ෂයේ නව උසස්වීම් ලබාදීම නිසා ඔහුට අසාධාරණයක් සිදු වී ද? එසේ නම් ඔහුට හිමිවිය යුතු සහනයන් කවරේද?'' යන්න පිළිබඳව වේ.''

**ඒ. විමලවීර,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2019 අගෝස්තු මස 02 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

09 - 292

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.